SRI LANKA

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර I විභාගය - 2021 ජනවාරි

## යෝජිත උත්තර

# (103) ආර්ථික විද්‍යාව (ECN)

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**
නො. 540, පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත,
නාරාහේන්පිට, කොළඹ 05.
දුරකථන: 011-2-559 669

මෙය අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශයේ ප්‍රකාශනයකි

## ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර I විභාගය – 2021 ජනවාරි

# (103) ආර්ථික විද්‍යාව

# යෝජිත උත්තර

**A කොටස**

(මුළු ලකුණු 40)

***පළමුවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ***

**1.1** (2)

**1.2** (3)

**1.3** (3)

**1.4** (4)

**1.5** (4)

**1.6** (1)

**1.7** (2)

**1.8** (1)

**1.9** (1)

**1.10** (2)

**1.11** ආන්තික පිරිවැය

**1.12** දකුණට

**1.13** අසත්‍යයි

**1.14** සත්‍යයි

**1.15** අසත්‍යයි

**1.16 සැපයුම් වක්‍රය වමට විතැන්වීමට හේතුවන සාධක**

- සම්බන්ධිත භාණ්ඩවල මිල ගණන් ඉහළ යාම
- නිෂ්පාදනයේ දී භාවිතා කරනු ලබන නිෂ්පාදන සාධකවල මිල ඉහළ යාම
- තාක්ෂණයේ යල් පැනයාම
- වෙළඳපොලේ සිටින සැපයුම්කරුවන් සංඛ්‍යාව පහත වැටීම.
- නිෂ්පාදන බදු අය කිරීම හෝ බදු අනුපාතය ඉහළ දැමීම.
- රජය විසින් නිෂ්පාදන සහනාධාර ඉවත් කිරීම.
- භාණ්ඩ මිල අනාගතයේ දී ඉහළ යනු ඇතැයි නිෂ්පාදකයින් විසින් අපේක්ෂා කිරීම

**1.17** ඉල්ලුම් ප්‍රමාණය වෙනස් වීම යනු ඉල්ලුම නිර්ණය කරන අනෙකුත් සාධක ස්ථාවරව තිබියදී මිල අඩුවීම හෝ වැඩිවීම නිසා ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය පෙරට වඩා අඩුවීම හෝ වැඩිවීමයි. එනම් වෙනස් වීමයි.
මෙය ඉල්ලුම් වක්‍රයක් දිගේ ලක්ෂ මාරු වීමක් මගින් පෙන්විය හැක.

මිල




**1.18 වැඩිවන පරිමාණානුකූල ඵල හේතුවන සාධක**

- සාධකවල අභාජ්‍යතාවය හෙවත් වෙන්කර දැක්වීමේ නොහැකියාව.
- ශ්‍රම විභජනය තුලින් හටගන්නා විශේෂායනය.
- පිරිමැසුම්දායි අධිතාක්ෂණික උපකරණ හා අධිතාක්ෂණය භාවිතා කිරීම.
- එක් වරක් පමණක් වැයකළ යුතු වියදම් පැවැතිම.

**1.19 ආන්තික ආදායම**

අනෙකුත් සාධක ස්ථාවරව තිබියදී නිමවුම හෝ අලෙවිය එක් ඒකකයකින් වැඩි කිරීමේදී මුළු ආදායමට අලුතින් එකතුවන ආදායම ආන්තික ආදායමයි.

$$\text{ආන්තික ආදායම} = \frac{\text{මුළු ආදායමේ වෙනස}}{\text{නිමවුමේ වෙනස}}$$

**1.20 වෙළෙඳපොළට රජය මැදිහත්වන ආකාරය**

- බදු අයකිරීම
- සහනාධාර සැපයීම
- මිල පාලන ප්‍රතිපත්ති හඳුන්වාදීම
    - උපරිම මිල පාලන ප්‍රතිපත්තිය
    - අවම මිල පාලන ප්‍රතිපත්තිය
- මිල ස්ථායිකරණ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම

***(එක් කොටසකට ලකුණු 02 , මුළු ලකුණු 40 යි)***

***A කොටසෙහි අවසානය***

*(මුළු ලකුණු 40 යි)*

**B කොටස**

## දෙවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ

**පරිච්ඡේදය 01 - ව්‍යාපාර පරිසරයට අදාළ ආර්ථික සංකල්ප හා ආර්ථික පද්ධති**

**(a) ප්‍රධාන නිෂ්පාදන සාධක**

- භූමිය
- ශ්‍රමය
- ප්‍රාග්ධනය
- ව්‍යවසායකත්වය

*(ලකුණු 02)*

**(b) වෙළෙඳපොළ ආර්ථික ක්‍රමයක මූලික ලක්ෂණ**

- මූලික ආර්ථික ප්‍රශ්න මිල ක්‍රමය මගින් විසඳීම
- පෞද්ගලික දේපොළ හිමිකම
- පෞද්ගලික ව්‍යවසායකත්වයක් දක්නට ලැබීම
- රජයේ මැදිහත්වීම අවම මට්ටමක පැවැතීම
- පාරිභෝගික ස්වාධිපත්‍යක් පැවැතීම
- වෙළඳපොළ තුළ තරඟකාරීත්වයක් දක්නට ලැබීම
- තෝරා ගැනීමේ නිදහසක් දක්නට ලැබීම

*(ලකුණු 04)*

**(c)**

i. **තේරීම යනු,**
විකල්ප ප්‍රයෝජන සහිත අවස්ථා අතරින් හොඳම අවස්ථාව තෝරා ගැනීමයි. එබැවින් හිඟ සම්පත් කුමන අරමුණක් සඳහා යොදා ගන්නවාද යන්න මින් අදහස් වේ.

*(ලකුණු 02)*

ii. පහත දැක්වෙන උපකල්පන භාවිතාකර නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් ගොඩනගා ගනු ලබයි.

- ආර්ථිකය විසින් භාණ්ඩ වර්ග දෙකක් පමණක් නිපදවීම.
- සලකා බලන කාලය තුළ ආර්ථිකය සතු සම්පත් ප්‍රමාණය ස්ථාවරව පැවැතීම.
- තාක්ෂණය නොවෙනස්ව පවතින බව
- සියලු සම්පත් පූර්ණ හා උපරිම කාර්යක්ෂමතාවයකින් භාවිතා කරන බව.

*(ලකුණු 02)*

*(මුළු ලකුණු 10 යි)*

## තුන්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ

| පරිච්ඡේදය 02 - ඉල්ලුම, සැපයුම, හා සමතුලිතය හා රජය මැදිහත් වන ආකාරය |
|---|

**(a)** සමතුලිතයේ දී

$$Qd = Qs$$
$$Qd = 3{,}600 - 7P$$
$$Qs = -200 + P$$

$$3{,}600 - 7P = -200 + P$$
$$3{,}800 = 8P$$
$$P = 3{,}800/8$$
$$P = 475$$

**<u>සමතුලිත මිල = රු. 475</u>**

P=475/- Qd සමීකරණය ආදේශ කරනු ලැබේ,

$$Qd = 3{,}600 - 7p$$
$$Qd = 3{,}600 - (7 \times 475)$$
$$Qd = 3{,}600 - 3{,}325$$
$$Qd = 275$$

**<u>සමතුලිත ප්‍රමාණය ඒකක = 275</u>**

*(ලකුණු 04)*

**(b)**

| පරිච්ඡේදය 03 - නිෂ්පාදන ක්‍රියාවලියේ හැසිරීම හා විවිධ වෙළෙඳපොළ ව්‍යුහයන් |
|---|

**නිෂ්පාදනයේ කෙටිකාලය :**

ස්ථාවර සාධක හා විචල්‍ය සාධක යන සාධක වර්ග දෙකම භාවිතා කරමින් භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදන ක්‍රියාවලිය කෙටිකාලීන නිෂ්පාදන ක්‍රියාවලිය ලෙස හැඳින්වේ. එනම් ස්ථාවර සාධක වෙනස් කළ නොහැකි කාලය කෙටි කාලයයි. ස්ථාවර හා විචල්‍ය යන සාධක වර්ග දෙකම පවතින බැවින් මුළු පිරිවැය තුළ ස්ථාවර පිරිවැය මෙන්ම විචල්‍ය පිරිවැය ද ඇතුළත් වේ. කෙටිකාලීන නිෂ්පාදන ක්‍රියාවලියේ හැසිරීම හීනවන ආන්තික නිෂ්පාදන න්‍යාය මගින් තීරණය වේ.

**දිගුකාලීන නිෂ්පාදනය :**

විචල්‍ය සාධක පමණක් භාවිතාකරමින් භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරනු ලබන කාලය නැතහොත් නිෂ්පාදන ක්‍රියාවලිය දිගුකාලීන නිෂ්පාදන ක්‍රියාවලිය ලෙස හැඳින්වේ. නැතහොත් ස්ථාවර සාධක වෙනස් කිරීමට ගතවන කාලය දිගු කාලයයි.

දිගු කාලයකදී විචල්‍ය සාධක පමණක් පවතින බැවින් පිරිවැය තුළ පවතින්නේ විචල්‍ය පිරිවැය පමණි. දිගු කාලීන නිෂ්පාදන හා පිරිවැයෙහි හැසිරීම තීරණය වන්නේ පරිමානුකූලඵල න්‍යාය මතයි.

*(ලකුණු 04)*

**(c)**

| **පරිච්ඡේදය 03 - නිෂ්පාදන ක්‍රියාවලියේ හැසිරීම හා විවිධ වෙළෙඳපොළ ව්‍යුහයන්** |
|---|

ඒකාධිකාරී තරඟකාරී වෙළෙඳපොළ තුළ පහත දැක්වෙන ආකාරයේ ලක්ෂණ දැකිය හැකි වේ.

- වෙළෙඳපොළ තුළ සැපයුම්කරුවන් (ආයතන) විශාල ප්‍රමාණයක් කටයුතු කිරීම.
- එක් එක් ආයතන විභේදනයක් සහිත භාණ්ඩ අලෙවි කිරීම.
- වෙළෙඳපොළ ආබාධ පිවිසුමක් හා ආබාධ පිට වීමක් දක්නට ලැබීම.
- කර්මාන්තයේ යෙදෙන ආයතනයන් ඉහළ නම්‍යතාවයකින් යුක්ත පහතට බෑවුම් වන ඉල්ලුම් වක්‍රයකට මුහුණ දීම.
- පූර්ණ සාධක සඵලතාවක් දක්නට ලැබීම.
- ඒකාධිකාරී තරඟකාරී ආයතන දිගු කාලයේදී සාමාන්‍ය ලාභ පමණක් උපයනු ලබයි. වෙනත් වචන වලින් කිවහොත් ආර්ථික ලාභ ශුන්‍ය වේ.
- අලෙවිකරණ ප්‍රචාරණ ඉහළ මට්ටමක පවතී.

*(ලකුණු 02)*

*(මුළු ලකුණු 10 යි)*

## *හතරවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ*

| **පරිච්ඡේදය 05 - මූල්‍ය පද්ධතිය, මුදල් හා සාමාන්‍ය මිල මට්ටම්** |
|---|

**(a) වාණිජ බැංකුවක කාර්යයන්**

- තැන්පතු භාර ගැනීම
- ණය සැපයීම
- චෙක්පත් හා බිල් රැස් කිරීම
- ණයවර ලිපි නිකුත් කිරීම
- සහතික කිරීමේ ලිපි නිකුත් කිරීම
- සංචාරක චෙක්පත් නිකුත් කිරීම
- ආරක්ෂිත සේප්පු පහසුකම් පවත්වාගෙන යාම
- විද්‍යුත් මුදල් හුවමාරුව
- ස්වංක්‍රීය මුදල් හුවමාරු යන්ත්‍ර පවත්වාගෙන යාම (ATM)
- ණය කාඩ්පත් හා හරපත් නිකුත් කිරීම
- කල් බදු (ලීසිං) පහසුකම් සැලසීම
- ණය සාධකකරණ සේවාවන් පවත්වාගෙන යාම

*(ලකුණු 04)*

**(b)**

වාණිජ බැංකුවක ප්‍රධාන අරමුණු දෙක වන්නේ ලාභ ලැබීම හා ද්‍රවශීලතාවය ආරක්ෂා කර ගැනීමයි. වාණිජ ආයතනයක් ලෙස වාණිජ බැංකුවක්ද ණය ගැනීම හා ණය සැපයීම හරහා ලාභ උපයනු ලබයි. කෙසේ වෙතත් වාණිජ බැංකු මූල්‍ය පද්ධතියේ ප්‍රධාන කොටස්කරුවන් වන බැවින් රටේ මුදල් සැපයුම කෙරෙහි සෘජු බලපෑමක් ඇති කරනු ලබයි.

බැංකු පද්ධතිය රඳා පවතින්නේ සේවාදායකයාගේ විශ්වාසය මතයි. එබැවින් ඉතා හොඳ ද්‍රවශීලතාවයක් ආරක්ෂා කරමින් මහජනතාව ඉල්ලූ විට ඔවුන්ගේ තැන්පතු ආපසු ලබා දීම ඉතා වැදගත් වේ.
ලාභ ඉපැයීම හා ද්‍රවශීලතාවය ආරක්ෂා කිරීම එකිනෙකට ප්‍රතිවිරුද්ධ වන්නා වූ අරමුණු දෙකකි. එක් අරමුණක් ඉටුවන විට අනෙක් අරමුණ ඉටුවීමට එය බාධාවක් වේ.

ලාභ උපයන විට ද්‍රවශීලතාවය ආරක්ෂා නොවන අතර ද්‍රවශීලතාවය ආරක්ෂා වන විට ලාභ ඉපයිය නොහැක. වාණිජ බැංකු තම වත්කම් ව්‍යුහය සකසා ගැනීම මගින් මෙම අරමුණු දෙකම ඉටු කර ගනී. එහිදී අඩු ද්‍රවශීලතාවයක් ඇති වත්කම් මගින් ලාභ උපයන අතර වැඩි ද්‍රවශීලතාවක් ඇති වත්කම් මගින් ද්‍රවශීලතාවය ආරක්ෂා කර ගැනීමත් සිදු කරනු ලබයි. මේ අනුව වාණිජ බැංකුවක් මෙම අරමුණු දෙක අතර සමතුලිතතාවයක් ඇති කර ගත යුතු වේ.

*(ලකුණු 04)*

**(c) උද්ධමනය ප්‍රධාන හේතු දෙකක් නිසා හටගනී.**

1. සමස්ත ඉල්ලුම ඉහළ යාම (ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය)
2. සමස්ත නිෂ්පාදන පිරිවැය ඉහළයාම (පිරිවැයෙන් තල්ලු වු උද්ධමනය)

*(ලකුණු 02)*

*(මුළු ලකුණු 10 යි)*

## *පස්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ*

| පරිච්ඡේදය 06 - අන්තර්ජාතික වෙළදාම සහ විදේශ විනිමය වෙළෙඳපොළ |
|---|

**(a) විදේශ වෙළදාමේ අවාසි**

- අත්‍යාවශ්‍ය නොවන පරිභෝජනයට නුසුදුසු භාණ්ඩ රට තුලට පැමිණීම.
- අධි විශේෂිකරණයෙන් ඇතිවන රටට අහිතකර බලපෑම් නිසාවෙන් වන අවාසි.
- අනෙක් රටවල් මත යැපීම.
- ප්‍රපාතනය වැනි දෑ හේතුවෙන් ආනයන භාණ්ඩ සමඟ තරඟ කල නොහැකිවීම.
- රටට හානිදායක ආනයනය සීමා රහිත වීම.

*(ලකුණු 02)*

**(b) ආරක්ෂණයේ වාසි**

- ජාතික ආරක්ෂාවට වැදගත්වීම.
- ආනයන භාණ්ඩ සමඟ තරඟයෙන් ආරක්ෂා වීම.
- ළදරු කර්මාන්ත තරඟයෙන් ආරක්ෂා වීම.
- දේශීය සම්පත් උපයෝජනය ඉහළ යාම.
- කර්මාන්ත විවිධාංගීකරණය.
- දේශීය රැකියා ආරක්ෂා වීම.
- ආයතනයක තීරු බදු මගින් ප්‍රපාතනය හේතුවෙන් ඇතිවන අවාසි මග හරවා ගැනීමට හැකි විම.
- රටට හානිදායක ආනයනය සීමා වීම.
- ආනයන අඩුවීම නිසා හිඟ ගෙවුම් ශේෂය යහපත් වීම.

*(ලකුණු 02)*

**(c) මුදල් අවප්‍රමාණයක ආර්ථික ප්‍රතිවිපාක**

1. **ආනයන වල මිල ඉහළ යාම**
   ඩොලරවලට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය විම නිසා පවතින ප්‍රධාන අවාසිය වන්නේ ආනයන මිල ඉහළ යාමයි. මේ නිසා ආනයනකරුට ඉහළ මිලක් ගෙවීමට සිදු වේ. අවසානයේ දී බදු බර පාරිභෝගිකයා වෙත පැවරේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස භාණ්ඩ හා සේවා වල මිල ගණන් ඉහළ යයි.

aat SRI LANKA

2. **අපනයන ආදායම් ඉහල යාම**

ඩොලරයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වීම නිසා අපනයන මිල පහත වැටී තරගකාරිත්වය ඉහළ නැගී විදේශික ගැනුම්කරුවන්ට ලාභදායි වේ. මේ හේතුවෙන් අපනයන ඉල්ලම ඉහළ ගොස් අපනයන ආදායම් ඉහළ යයි.

3. **උද්ධමනය ඉහළ යාම**

ඩොලරයට සාපේක්ෂව මුදල් අවප්‍රමාණය හේතුවෙන් අමුද්‍රව්‍ය හා අනෙකුත් භාණ්ඩ හා සේවාවල මිල ගණන් ඉහළ යාම නිසා උද්ධමනයක් හටගනී.

4. **ගෙවුම් ශේෂයේ හිඟයක් හටගැනීම**

ශ්‍රී ලංකාවේ අපනයන ආදායමට වඩා ආනයන වියදම් ඉහළ මට්ටමක පවතී. ආනයන මිල ඉහළ යාම හේතුවෙන් රජයට ගෙවුම් ශේෂ හිඟය පියවා ගැනීම සහා වැඩිපුර ණය ලබා ගැනීමට සිදු වේ.

5. **රජයට විදේශ ණය පොලී ලෙස වැඩි ප්‍රමාණයක් ගෙවීමට සිදු වීම.**

රුපියල අවප්‍රමාණය විම නිසා රජයට වැඩි ප්‍රමාණයක් විදේශ ණය ආපසු ගෙවිමට සහ ණය පොලී ගෙවීමට සිදු වේ. එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රාග්ධන ආයෝජනයන් පහත වැටීමද තවද ණය පියවීම සඳහා වෙනත් ණය ලබා ගැනීමට ද සිදු වේ.

6. **විදේශ සෘජු ආයෝජන අඩුවීම**

මුදල් අවප්‍රමාණය විම හේතුවෙන් විදේශිකයන් ශ්‍රී ලංකාවේ මුදල් ආයෝජනය කිරීමට අකමැති වීම. නමුත් විදේශ සෘජු ආයෝජන රටේ සංවර්ධනයේ ප්‍රධාන මූලාශ්‍රයන් වේ.

7. **ජීවන වියදම් පහත වැටීම**

මෙම හේතු නිසා ශ්‍රී ලාංකීය ජනතාව පාරිභෝජනය සඳහා සිදු කරනු ලබන වියදම් පහත වැටී ජීවන තත්ත්වය පහත වැටීම හා මුදලේ නියම අගය අඩු වේ.

*(ලකුණු 06)*

*(මුළු ලකුණු 10 යි)*

aat SRI LANKA

***B කොටසෙහි අවසානය***

*(මුළු ලකුණු 20 යි)*

**C කොටස**

## *හයවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරː*

**පරිච්ඡේදය 04 - ජාතික ගිණුම්කරණය හා රජයේ කාර්යභාරය**

**(A)**

**(a) වෙළෙඳපොළ මිලට දළ දේශිය වියදම** **(රුපියල් මිලියන)**

| | | |
|---|---|---|
| පෞද්ගලික පරිභෝජන වියදම | = | 600 |
| රාජ්‍ය පාරිභෝජන වියදම | = | 500 |
| දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | = | 400 |
| තොග වෙනස්වීම | = | 200 |
| **වෙළෙඳපොළ මිලට දළ දේශිය වියදම** | = | **1700** |

*(ලකුණු 05)*

**(b) වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය** **(රුපියල් මිලියන)**

| | | |
|---|---|---|
| වෙළෙඳපොළ මිලට දළ දේශිය වියදම | = | 1700 |
| එකතු කලා- අපනයන | = | 400 |
| අඩු කලා- ආනයන | = | (250) |
| **වෙළෙඳපොළ මිලට දළ දේශිය නිෂ්පාදිතය** | = | **1850** |

*(ලකුණු 03)*

**(c) වෙළෙඳපොළ මිලට දළ ජාතික ආදායම** **(රුපියල් මිලියන)**

| | | |
|---|---|---|
| වෙළෙඳපොළ මිලට දළ දේශිය නිෂ්පාදිතය | = | 1850 |
| ශුද්ධ විදේශිය සාධක ආදායම | = | (100) |
| **වෙළෙඳපොළ මිලට දළ ජාතික ආදායම** | = | **1750** |

*(ලකුණු 02)*

**(B)**

**(a)**

සාර්ව ආර්ථික අරමුණු ඉටුකර ගැනීම සඳහා රජය විසින් අනුගමනය කරනු ලබන රාජ්‍ය වියදම්, බදු සහ රාජ්‍ය ණය හා සම්බන්ධ ආර්ථික ප්‍රතිපත්තිය **රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය** ලෙස හැඳින්වේ.

ආර්ථික ස්ථායිතාව හා වර්ධන අරමුණු ඉටුකර ගැනීම සඳහා මුදල් සැපයුම හා පොලී අනුපාතය හැසිරවීමට අදාල ආර්ථක ප්‍රතිපත්තිය **මූල්‍ය ප්‍රතිපත්තියයි.**

*(ලකුණු 04)*

**(b)**

රාජ්‍ය ආදායම ඉක්මවා රාජ්‍ය වියදම් පවතින ආකාරයේ අයවැය ලේඛණයක් හිඟ අයවැය ලේඛණයක් ලෙස හැඳින්වේ.

**අයවැය හිඟය** = රාජ්‍ය ආදායම - රාජ්‍ය වියදම

= රුපියල් මිලියන 300- රුපියල් මිලියන 350

= **(රුපියල් මිලියන 50)**

*(ලකුණු 02)*

**(C)**

**(a)**

- සුඛසාධන භාණ්ඩ පරිභෝජනය දිරි ගැන්වීම
- පොදු භාණ්ඩ සැපයීම
- අර්ධ පොදු භාණ්ඩ සැපයීම
- හානිදායක භාණ්ඩ සැපයීම සීමා කිරීම

*(ලකුණු 02)*

**(b) රජය අසාර්ථක වීමට හේතු**

- දේශපාලන ආත්මාර්ථකාමිත්වය
- පරිපාලන වියදම් ඉහළ මට්ටමක පැවතීම
- රාජ්‍ය මැදිහත්වීම් මගහැරවීම
- වෙනස් වන ව්‍යාපාරික පරිසරයට අනුගත නොවීම

*(ලකුණු 02)*

*(මුළු ලකුණු 20 යි)*

***C කොටසෙහි අවසානය***

***Notice:***

These answers compiled and issued by the Education and Training Division of AAT Sri Lanka constitute part and parcel of study material for AAT students.

These should be understood as Suggested Answers to questions set at AAT Examinations and should not be construed as the "Only" answers, or, for that matter even as "Model Answers". The fundamental objective of this publication is to add completeness to its series of study texts, design especially for the benefit of those students who are engaged in self-studies. These are intended to assist them with the exploration of the relevant subject matter and further enhance their understanding as well and stay relevant in the art of answering questions at examination level.

*© 2021 by the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka). All rights reserved. No part of this document may be reproduced or transmitted in any form or by any means, electronic, mechanical, photocopying, recording or otherwise without prior written permission of the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*